

# සංක්‍රමණිකයකුගේ සටහන

## කච්ඡපූටලා.....

ටෙලි නාට්‍ය චිත්‍රපට **VCD, CD, DVD** වෙලඳාම අපේ ශ්‍රී ලාංකික කඩවල දැන අනිවාර්ය අංගයක් වෙලා හමාරයි. මිනිස්සු දැන් ඒවට ඇසික් වෙලා ඉන්නේ. ඒ හරහා සිදුවන බලවත් අසාධාරනයක් ගැනයි මේ අවනඩුව ලංකාවේ විකාශනය වන ටෙලිනාට්‍ය චිත්‍රපට මෙහෙ ගෙනත් පෙන්නුවට අපේ අවුලක් නැහැ. එහෙත් ඒ අතරම මෙහේ විවිධ සංවිධාන විසින් කුමන හෝ සද් ක්‍රියාවන්ට ආධාර වශයෙන් අරමුදල් ගොඩනැගීම පිනිස ගෙන්වා ප්‍රදර්ශනය කිරීමට සූදානම් වන චිත්‍රපට හා ටෙලිනාට්‍ය ඒවා ප්‍රදර්ශනයට හා නියමිත දිනට පෙර හොර රහසේ නරඹන්නන්ට අලෙවි කිරීම නම් කච්ඡපූට වැඩක්. සංවිධායකයින් දහස් ගනන් වියදම් කර ආරාධිත ශිල්පීන් ගෙන්වා, ශාලා වෙන් කරවා ප්‍රචාරය කර සූදානම් වන දර්ශනයක් සුළු මුදලකට ඊට පෙර නිකුත් කිරීමෙන් ඔබ කරන්නේ බලවත් අසාධාරනයක්. එහි බලපෑම සංවිධානවලට පමනක් නොව එම සද්ක්‍රියාවෙහි අරමුනටද හානිකරවන්නට ඉඩ තිබේ. එම නිසා වෙලඳ සල් හිමියන්ගෙන් අප කරුනාවෙන් ඉල්ලා සිටින්නේ ප්‍රදර්ශනයට සූදානම් කර ඇති කුමන චිත්‍රපටයක් ටෙලිනාට්‍යයක් ඊට පෙර එහි පිටපත් ඔබට ලැබී ඇත්නම් එහි පිටපත් ජනතාව වෙත නිකුත් කිරීමෙන් වලකින ලෙසයි. බොහෝවිට ඔබ ඒවා අලෙවි කරන්නේ ඔබේ හිතවතුනට වුවද එම හිතවතාට ඔබ මෙන් තවත් හිතවතුන් බොහෝ ප්‍රමානයක් සිටින්නට ඉඩ තිබේ. ප්‍රශ්නය ඇත්තේ එතනයි.

## වාද බයිලා

බයිලා හා වාද බයිලා කියන්නේ අමාරුවෙන් ප්‍රගුන කල යුතු කලාවක්. කවි සින්දු නම් ඕනෙම කෙනෙකුට කියන්න පුළුවන්. එහෙත් වාද බයිලා ගායනයට උපන් හැකියාවක් තිබිය යුතුයි. ඒත් අපේ ගායකයන් විසින් බයිලාවට කරන ලද විකෘති කිරීම් නිසා එහි අගය හීන වී එය ලාබ හා සිල්ලර කලාවක් ලෙස හංවඩු ගැසී තිබේ. මෙල්බන් වල වාද බයිලා තරඟයක් පැවැත්වීම තරමක අළුත් දෙයක් වුවත් ජන සහභාගීත්වය මද වීමට එයත් හේතුවක් වෙන්න ඇති. අපේ කාලයේ උදව්යට බයිලා තරඟ කිව්වම මතක් වෙන්නේ වොලී බැස්ටියන්ලා - තොටලඟ කුසුම්පාල මිල්ටන්ලා වගේ කට්ටිය. රබානක්, ඩොල්කියන්, සර්පිනාවක්, වයලීනයක් සමග කොට උඩ වේදිකාවක කරන වාද බයිලාවක රසය ගෲප් එකක් බැක් කරන තරඟයක නොදැනුනේ ඒක නිසා වෙන්න ඇති. හැමදේම නවීකරනය වෙන ලෝකේ ප්‍රවීනයන් නැතිව ගියත් ගෲප් එකක් බැක් කරලා හරි මේවා පවත්වාගෙන යන එන අගය කල යුතුයි. ආර්ථික වශයෙන් ලාබ නොලැබුවත් අළුත් වැඩක් කිරීමේ තෘප්තිය සංවිධායකයින්ට ඇති. ඔවුන්ගේ ඒ උත්සහයටයි මේ ආචාරය. ඒ සමගම මේ දෙයද කිව යුතුය. මෙවැනි ප්‍රසංග යක් පැවැත්වීමේදී ඒ සඳහා උචිත කාලය පිළිබඳවත් ප්‍රවේශපත්‍රයකට නියම කරන ලද මිල ගැනත් මීට වඩා සැලකිලිමත් උනානම් අගෙයි කියා සිතෙනවා.

## විමල්...

විමල්ගේ කේස එක ගැන මුළු රටම දන්න නිසා අපිත් ඒ කුනු ගැන ලියන එකේ තේරුමක් නැහැ. අපි මේක කේස් එකක් කියල ලඝු කලේ එතන අපට පේන්න දේශපාලනමය විවේචනයක් හෝ මතවාදී අරගලයක් හෝ මොනයම් දෘෂ්ඨියමය ගැටළුවක් නැහැ ඇත්තේ තනිකරම කලක් තිස්සේ වර්ධනය වුන පුද්ගලික බල අර්බුදයක් විතරයි. දෙපැත්තම කියන කතන්දර දිහා බලන්න විමල් කුමන්ත්‍රනකාරයෝ ගැන කියන කොට අනෙක් කට්ටිය හෝටල් බිල් ගැනයි, නියෝග වලට අවනත නොවීම ගැනයි කියනවා අන්තිමට පැනි වරකා ගහටත් හෙන ගැහුවා වගේ සේරම පත්තු වෙලා රටම හිනස්සමින් ලොකු මඩ වලකට බහින්න හදන්නේ කට්ටිය. විමල්ම කියන විදියට අවුරුදු 20ක් පක්ෂය තුල ඉඳලත් පක්ෂය කියන්නේ මොකක්ද කියලා තේරුම් අරන් නැති හැටි ප්‍රශ්නයක් තිබේනම් කට්ටියත් ඉදීනම් ඇද ගන්න ඕනේ නායකත්ව කමිටුවක හරි පක්ෂ සම්මේලනයකදි මිසක් පාර්ලිමේන්තුවට ගිහින් අහවල් දෙයක් කරන්නද? එහෙදී ඇඬෙන කථා කියලා පක්ෂ නිවැරදි කරන්න පුළුවන්ද? විමල් හැමදාමත් කතා කලේ මිනිස්සුන්ගේ හදවතට මිසක් බුද්ධියට නෙමෙයිනේ. ඒක හැමතැනටම ගැලපෙන්නේ නැහැ. විමල් පක්ෂය නිවැරදි මාර්ගය ගන්න ඔනෙ නම් කුමන්ත්‍රණකාරයො ගැන එලිකරන්න තිබුනේ පක්ෂය අතුලතදිනේ. එතන ඉඳලා නේද අරගල කල යුත්තේ බැරි නම් දමලා ගහලා ගිහින් අළුතින් දෙයක් පටන් ගන්න පුළුවන්නෙ ඇයි ඔය කවුරුත් ජ.වි.පෙ. දාලා යන්න අකමැති. ඒකෙම එල්ලීගෙන ඒකේ දිගුවක් වෙන්න හදන්නේ. විමල් හරි උනත් ආපු ක්‍රමේ වැරදියි. නිකං හොරාට කලින් කැන වැට පැන්නා වගේ. අපහට විමල් සහ කට්ටිය ගැන දුකයි. ඒත් විමල්ගෙ ජීවිතේ අවුරුදු තිස් ගනනක්නේ ගෙවුනේ. ඔය ලස්සන ජීවිතයකට මාවත විවෘත වෙලා තියෙන්නේ. ලක්ෂ ගනන් ජීවිත පූජා කරපු පක්ෂයක් නිසා ඔය තැනට ආපු එක අමතක කරලා දාන්න. යාගන්න බැරි උන සීගිරි දඹුළුත් යන්න. ඒත් එතකං ටිකක් පරිස්සමින්. අනෙක් අතට ජ.වි.පෙ. වගේ පක්ෂයක ගැටුම් මතවාද ඇතිවීම ස්වභාවිකයි. විශේෂයෙන් සභාගයක කොටස් කාරයෝ වෙන්න ගියහම ඒත් ගැටුමකදි ඊට මුහුන දීම අවබෝධයෙන් කල යුත්තක් ඒත් මේසා විශාල අද්දැකීම් ඇති පරිනත නායකත්වය මෙහිදී කියපු කරපු විදිහ අනුමත කරන්නේ කොහොමද? මෙවැනි ගැටුමකදී තමන්ගේ නායකත්වය විනයවාදී බව කොපමන අගේට ජනතාවට ඔප්පු කරලා පෙන්නන්න තිබුනද? ඒත් සිද්ධියට පස්සේ සිදුවුන දේවල් ගැන හිතනකොට මහ ඉහලින් කථා කරන පක්ෂ විනයට මොකද උනේ කියලා හිතනවා. ඇත්ත තමයි ආවේග පාලනය කරන එක අමාරුයි. ඒත් සිදුවුන දේවල් සිදුවුන හැටි දැක්කම අපිට කනගාටුයි. අපිට කිව්වේ බලාපොරොත්තු තියාගෙන හිටපු සමස්ථ ජනතාවට

## අවුරුදු කෑම

ටෙක් එකේ කට්ටිය අවුරුද්දකට සැරයක් කරන බක් මහ උලෙල ගැන අපි හැමවිටම උදව්වෙනවා. ඒ මේක කරන්න වෙන මහන්සිය ගැන හොඳ තක්සේරුවක් අප තුල ඇති නිසා වසරකට වතාවක් මුළු මෙල්බර්නවලම ශ්‍රී ලාංකිකයන්ට මුන ගැහිලා විනෝද වෙන්න තියෙන එකම තැන දිනය තමයි ඒක. අවුරුද්දට ඇවිල්ලා තියෙන විදියට අවුරුදු කෑම කාලා අපි හවසට විසිරෙන්නෙ සතුටින්. ඒත් අපේ ශිෂ්‍ය මල්ලිලා අවුරුද්ද කන්න ඇවිල්ලා කාගන්න හදන එක නම් ගුන වැඩක් නෙවෙයි. වැඩේට සෙට් වෙන්න කීප දෙනෙක් උනාට ඒක දුරදිග යාමෙන් වැටෙන කළු පැල්ලම ශ්‍රී ලාංකික සමාජයටම වැදෙන්න පුළුවන් ඒක නිසා මල්ලිලාගෙන් ඉන්න එන්න කන්න චින්නම් ගස් යටට වෙලා බොන්න ප්‍රශ්නයක් නැහැ. බීලා කරන ඒවා ග්‍රවුන්ඩ් එකෙන් පිටට ගිහිල්ලා කරන්න. මොකද අපි මේ උත්සවේ දිගටම දකින්න කැමති නිසා. අපි කැමති ටෙක් එකේ බක් මහ උත්සවේ දා හවසට පොලිස් වෑන් ග්‍රවුන්ඩ් එකවටේ කැරකෙනවා දකින්න. සංවිධායක සහෝදර වරුනේ ලබන සැරේ මේ ගැන අවධානයෙන් ඉන්න.

සංක්‍රමණිකයා

*From page 10 (Religion for peace)*

extreme radical sinhala Buddhists is one of the main causes for the Tamil problem. Are we interested in quoting truth only when it suits us ? Are we open to truth as expressed by others?

Shyamon says that intermarriages are discouraged and frowned upon by other faiths. I thought this was a common trait in all religions. One has to only look at the marriage columns in the Sri Lankan newspapers, where cast and religion are very important considerations in match making in Sri Lanka. How is it that Shyamon missed this vital piece of information but could only see the problem existing in other religions and cultures?

Shyamon claims that in the 11th century, war was sanctioned by the Pope. Mate, in today's Sri Lanka war is being actively promoted as being the solution to the current ethnic problem by religious leaders, government officers and extreme sinhala radical groups. He readily sees the Pope as a war monger but not his own extreme Shalala radicals.

The article says, children are taught the superiority of their own religion and the inferiority of all other religions. Christianity is a religion that neither says it is superior nor inferior to other religions. It stands on its own and measures it's success not in relation to other religions but in the degree to which it is faithful to its central message.

Shyamon quotes Salman Rusdhie in his article. I think, we need a Rusdhie born into every religion!! In today's world we need to expose the myths, falsehoods, cult practices preached and practiced by every religion and the corruption of its priests bared open to the public and it's faiths and doctrines questioned. We need every religion brought under the microscope and question its belief systems, practices and theologies. We can no longer hide truth from a world that is increasingly becoming very pragmatic and honest. Will Shyamon promote such investigatory approach to all religions?

Christianity is one religion where it's books are open for independent investigations. It's doctrines are daily criticised, questioned and denounced, It's priest's wrongful conducts are investigated and publicly condemned. Only recently the catholic church paid millions of dollars as compensation to childhood victims of rapes committed by it's priests. There are scientists and writers who are well paid to investigate and report on the truth or not of deeply held Christian beliefs like the virgin birth and the Christ's resurrection. What Rusdhie says is that the search light should be brought against all religions. Does Shyamon like the idea? Rushdie is doing it with Islam and many well paid researchers are doing it with Christianity. Will Shyamon encourage public debate and discussions to determine the truth or not of other religions, their practices, doctrines and the conduct of their religious hierarchy? Or, is it that only other religions are corrupt, violent and false?!!

It is strange that Shyamon asserts that in Christianity, children are 'brainwashed' at an early age to accept the Christian faith. I would have thought the opposite was true, where children are encouraged to question and debate the Christian faith. It is a religion that is continuously on the quest for truth and will openly invite debate and discussions about it's doctrines.

Shyamon's article gave me the impression that sometimes we seem to think that everything on the other side is bad and ugly and that everything on our side is good and respectful. But conventional wisdom dictates that good and bad exist in every area of human activity and endeavour.

We all belong to only one race, the human race. And we share a great deal in common, have similar aspirations for our families. To stereotype a whole section of people or a religion is to give insult to the aspirations of the majority who want to live peacefully with people of all faith. We should be able to transcend cultural, social, religious and even historical boundaries and learn to live in meaningful relationships. Let us learn to focus on things that unite us and not on things that divide us.

If Sri Lanka needs peace, then one of the first things writers and leaders must do and promote is to recognise the wealth of knowledge, experience and wisdom that exist in other cultures, religions and languages and that these can be and should be harnessed to build a stable and strong Sri Lanka. But if these 'other' groups are being described as war mongers, falsehoods, religious poison, problem God, tribes, brainwashers, divisive forces, then I am afraid we are already on the way to conflict and not peace.